# නර්තනය

## 12 ශ්‍රේණිය







**රත්නපුර අධ්‍යාපන කලාපය**

**සෞන්දර්ය අංශය**

**2021**

# නිපුණතා මට්ටම 2 . 1 - රස භාව සංකල්පය පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.

## ක්‍රියාකාරකම - රස - භාව පිළිබඳව උගනිමු

12 ශ්‍රේණිය නර්තනය -දෙවන වාරය.


සැකසුම ; ඩී.එල් ජගත් චන්ද්‍රලාල්

ශාස්ත්‍රපති (කැළණිය) අධ්‍යාපනපති(කොළඹ)
ප්‍රාසංගික කලා විශේෂවේදී(කොළඹ)
අධ්‍යාපන ඩිප්ලෝමා (කොළඹ
නෘත්‍ය විශාරද කථක්/මණිපූරි (ලක්නව්)

නර්තනාචාර්ය ක/තිස්ස මධ්‍ය මහා විද්‍යාලය
කළුතර


2021/06/04

# 3 . රස සංකල්පය හඳුනා ගැනීම

- රස පිළිබඳව විවිධ නිර්වචන රාශියක් ඇති බව.
- 1.රස යනු ආශ්වාද යයි. හෙවත් වීඳීමයි.
- 2.චමත්කාරයේ දී ඇතිවන්නා වූ හැඟීම් රස යනුවෙන් හඳුන්වන බව.
- 3.අනේක විධ භාව සංචාරී,ස්ථායී ආදී භාවයන් හා විභාව,අනුභාව ආදී යෙහි සංයෝගයෙන් ප්‍රකට වන්නා වූ බාහිර ස්වරූපය රස යයි.
- 4." විභාවානුභාව ව්‍යභිචාරී සංයෝගාද් රස නිෂ්පත්ති " ඒ අනුව භරතමුනිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රයේ 6 වන පරිච්ඡේදයේ දැක්වෙන ඉහත රස සූත්‍රයට අනුව රස නිෂ්පත්තිය සඳහා විභාව,අනුභාව හා ව්‍යභිචාරී භාව සංයෝගයෙන් රස නිෂ්පත්තිය සිදු වන බවයි.
- 5."යතෝ හස්තස්තතෝ දෘෂ්ඨිර්යතෝ දෘෂ්ටිස්තතෝ මනා- යතෝ මනස් තතෝ භාවෝ යතෝ භාවස් තතෝ රසං " නැටුමේ දී අත් යන තැනට ඇස්ද යා යුතුය.ඇස් යන තැනට සිතද යා යුතු ය.සිත යන තැන භාවයන් පහළ විය යුතු ය.භාවය පහළ වූ විට රසය මතුවය යුතු ය.



D.L.J.CHANDRALAL.

# 4. රස නිෂ්පත්තියට හේතු වන ප්‍රධාන සාධක.

- 1. විභාව ;යම් හැඟීමක් ඇඟවීම සඳහා මිනිසා තුළ ඇති වන චෛයිතසික වෙනස විභාව යැයි කියනු ලැබේ.නැතහොත් ස්ථායි භාවයන් අවධි කරීමට /ඉපැද්ද වීමට හේතු වන දෙය විභාව යයි.



විභාව ප්‍රධාන කොටස් දෙකකට බෙදෙන බව. 1.ආලම්භන විභාව ;ස්ථායි භාවයක් ඇතිකකිරීමට බලපාන හේතුව. /මනෝභාවයට කෙළින් ම අරමුණු වන වස්තුව.

2.උද්දීපන විභාව ;අරමුණේ එල්බගෙන උපන් මනෝ භාව තීව්‍ර කිරීම සඳහා හේතු වන දෙය/යම් පුද්ගලයකු තුළ ඇති ස්ථායි භාව පිබිදීමට හේතු වන දෙය.

2. අනුභාව ; විභාවයන් මුල් කරගෙන අවධි වූ ස්ථායි භාව ප්‍රදර්ශනය කරලීමයි.

3.ව්‍යභිචාරී භාව; ස්ථායි භාවයක් හට ගත් කල්හී එම භාවයන් කෙරෙන් පැන නගින දිය බුබුළු මෙන් ඇතිව නැතිවන ලක්ෂණ යයි.නැතහොත් ස්ථිරවම නොපවත්න භාව යයි.

D.L.J.CHANDRALAL.

# 5 භාව හා රස.

- භාව - දෘශ්‍ය කාව්‍යයේ අර්ථය මතු කිරීම භාව නම් වේ.නර්තනයේ දී එයින් උපදින රසභාව අර්ථය හැඟීම් ඉදිරිපත් කිරීම හෝ මතුකර දැක්වීම භාව දැක්වීම ලෙස අර්ථ දක් වන බව.
- රස දැක්වීම සඳහා පෙරටු වන්නේ රසයට අදාළ භාවය වන බව.
- භරතමුනි වරයා විසින් සිය නාට්‍ය ශාස්ත්‍රය ග්‍රන්ථයේ භාව 08 ක් හා එයින් ඇතිවන රස 08 ක් සඳහන් කර ඇත.
- පසු කාලීනව ශාන්ත භාවය එකතු වීම නිසා ශාන්ත රසය ද එක්ව එය නව **නාට්‍ය රසය/නව නළු රස** ලෙස භාවිතයේ පවතන බව.
- ශ්‍රී ශංකුක නම් පඬිවරයා විසින් ශාන්ත රසය හඳුන්වා දුන් බවට මතයක් පවතින බව.



# 6. නව නළු රස.

"ශෘංගාර හාස්‍ය කරුණා-රෞද්‍ර වීර භයානකං ඃ
බීභත්සයාද් භූත ශාන්තස්‍ය චේති නව නාට්‍ය රසාස්මෘතා"

හාවය.

- 1.රති
- 2.හාස
- 3.ශෝක
- 4.ක්‍රෝධ
- 5.උත්සාහ
- 6.භය
- 7.ජුගුප්සා
- 8..විස්මය
- 9 ශාන්ත



රසය.

- ශෘංගාර
- හාස්‍ය
- කරුණ
- රෞද්‍ර
- වීර
- භයානක
- බීභත්ස/බීභත්ස්‍ය
- අද්භූත
- ශාන්ත



D.L.J.

# 7 .රස-භාව පිළිබඳ  අදහස් දැක් වූ මතධාරීන්.

භාරතීය

1.භරතමුනි

2.නන්දිකේශ්වර

3.ආනන්දවර්ධන

4.උද්ගම ධනංජය

5.අභිනව ගුප්ත

6 ශ්‍රී සංකුක

දේශීය

1.එදිරිවීර සරච්චන්ද්‍ර

2.ජයදේව තිලකසිරි

3.ඒ..වී.සුරවීර

4.සුචරිත ගම්ලත්

5.ආනන්ද අබේසිරිවර්ධන

6    වෝල්ටර් මාරසිංහ

අපරදිග

1.ඇරිස්ටෝටල්

2.ප්ලේටෝ

3.සොක්‍රටීස්

4.ලියෝතෝල්ස්තෝයි

5.කාල් මාක්ස්

6.එංගල්ස්





D.L.J.CHANDRALAL.

# 8. භාරතීය නර්තන සම්ප්‍රදායන්හි රස--භාව නිරූපණ අවස්ථා හඳුනා ගැනීම

★භරත,කථක්,කථකලි,මණිපුරි,කුච්චිපුඩි,ඔඩිසි,මෝහිණී ආට්ටම්,ස්තත්‍රියා ආදී නර්තන වලට අදාළ රස-භාව නිරූපණ අවස්ථා ඡායාරූප මගින් හඳුනා ..ගත යුතු බව..


## ශෘංගාර



## හාස්‍යය



## කරුණා



D.L.J.CHANDRALAL.

# 9 රස-භාව නිරූපණ අවස්ථා

වීර



රෞද්‍ර




භයානක




බීභත්ස



අද්භූත



ශාන්ත



D.L.J.CHANDRALAL.

# 10. දේශීය ශාන්තිකර්යන්හි රස-භාව නිරූපණය

- උඩරට,පහතරට හා සබරගමු ශාන්තිකර්මහී රස-භාව නිරූපිත අවස්ථා ගණනාවක් ඇති බව.
- එකී අංග වල සතර අභිනය භාවිතයේ සුවිශේෂතා හඳුනාගත යුතු බව.
- අනුකරණය,අනුරූපණය,සමාරෝපය වැනි ලක්ෂණ එම අංග වල ගැබ්ව ඇති අයුරු අධ්‍යයනය කළ යුතු බව.
- විෂය නිර්දේශයේ අන්තර් ගත උගුරා යක්කම,රීරී යකා,නානුමුරය හා පොත් කඩේ පාළිය යන අංගයන්හී චරිතනිරූපණ කාර්යයේ දී ශාන්තිකර්ම කරුවා යොදා ගන්නා උපක්‍රම හා කුසලතා පිළිබඳව අධ්‍යයනය කළ යුතු බව.
- විශේෂයෙන් සන්නියකුම,රටයකුම,කිරිමඩුව, ආදී ශාන්තිකර්මවල රස-භාව නිරූපණ අවස්ථා හඳුනාගත යුතු බව.



# 11 ශාන්තිකර්මයන් හී රස-භාව නිරූපණ අවස්ථා ඡායාරූප මගින් හදුනා ගැනීම

නානුමුරය



කපුයක්කාරිය



දරුනැළවීම



සූනියම් යක්ෂණිය.



සළු පාළිය.



රීරී යකා



# 12 චරිත නිරූපණ අවස්ථා- 2

පොත්කඩේ යක්කම

මරුවාගේ රංගනය

දෙවොල් ගොඩ බැසීම










අඹ විදමන







වඩිග පටුන--සුනියම.



පන්දම් පාළිය-බෙන්තර



# 13 ඇගයීම.



- 1.රසයක් දැක්වීම සඳහා පෙරටු වන්නේ කුමක් ද?
- 2.රස නිෂ්පත්තිය සඳහා පෙරටු වන ප්‍රධාන සංයෝග තුන නම් කරන්න.
- 3.ස්ථිරවම නොපවතින භාවය කුමක් ද?
- 4.විභාව බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
- 5.නව නළු රස හා ඒ හා සම්බන්ධ භාවයන් නම් කරන්න.
- 6.සන්නියකුම් යාගයෙහි රස භාව දැකිය හැකි අවස්ථාවන් දෙකක් තෝරා ගෙන එහි විශේෂතා පෙන්වා දෙන්න.
- 7.රටයකුම් ශාන්තිකර්මයේ නානුමුරය පෙළපාළියෙහි ඇඳුරා, රස භාව නිරූපණයෙහි දක්වන කුසලතාව විචාරයට ලක් කරන්න.



D.L.J.CHANDRALAL.



8.සන්නියකුම් යාගයෙහි රීරි යකාගේ චරිත නිරූපණය පිළිබඳ විමසුමක් කරන්න..

9..සබරගමු සම්ප්‍රදායේ පහන් මඩුව යාගයේ පොත්කඩේ පාළියෙහි ඇති සුවිශේෂතා ඇගයීමට ලක් කරන්න.



10.කෝළම් නාටක තුළ ඇති රස භාව නිරූපණය විචාරයට ලක් කරන්න.
( ජස/මුදලි/නොංචි චරිත ඇසුරින් )

D.L.J.CHANDRALAL.

# 15.. ආශ්‍රිත ග්‍රන්ථ හා ඔබ විසින් පරිශීලනය කළ යුතු ග්‍රන්ථ..


1..සීරිමතී රසාදරි.**නර්තන කලා භාරතීය නෘත්‍ය සංග්‍රහය**.(2001).කොළඹ.විශ්ව ප්‍රකාශන..

2.ජයසේන කෝට්ටගොඩ.පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය(1997).කොළඹ:දළුවත්ත පින්ටර්ස්.

- 3.ජයසේන කෝට්ටගොඩ.**භාරතීය සම්භාව්‍ය නර්තන කලාව**.(2001).ජේ..කේ.ප්‍රබ්ලිකේෂන්ස්.බොරලැස්ගමුව;කර්තෘ ප්‍රකාශනයකි.
- 4.ජයසේන කෝට්ටගොඩ .**සාම්ප්‍රදායික ඇඳුම් ආයිත්තම් සහ වෙස් ගැන්වීමේ කලාව**.(2018).බොරලැස්ගමුව;ජේ.කේ.පබ්ලිකේෂන්ස්.
- 5.වෝල්ටර් මාරසිංහ.**භරතමුනි ප්‍රණීත නාට්‍ය ශාස්ත්‍ර**.(2004).කොළඹ:ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.
- 6 සේනාරත්න පතිරණ. **නන්දිකේශ්වරයන්ගේ අභිනය දර්පණ**.(1991).කොළඹ;ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.
- 7.සේනාරත්න පතිරණ. **දක්ෂිණ භාරතීය කථකලි නෘත්‍ය නාටකය**.(2003).නුගේගොඩ;ජේ.ඇන්ඩ්.ජේ.ප්‍රකාශකයෝ
- 8.ජාතික අධ්‍යාපන ආයතනය .**12 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත**.(2018).මහරගම.
- 9.යොහාන් පුංචිනිළමේ,**සබරගමු නළු ඇඳුම් පැළඳුම්** (20015).කතෘ ප්‍රකාශනනයකි.
- 10 මුදියන්සේ.දිසානායක.**සිංහල නළු ඇඳුම් පැළඳුම්** :1993 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ප්‍රකාශනයකි.




ඔබ සැමගේ අධ්‍යාපන කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා □

ස්තුතියි

රත්නපුර කලාපයේ සෞන්දර්ය අංශයේ ආරාධනයෙන් මෙම සත්කාර්යට දායක උණෙමි.



